සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....................................

## 52 - නර්තනය (දේශීය) - I

කාලය පැය 02 යි

- අංක 01 - 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.
- උපදෙස් :- මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

---

01. ' වෛදිකා නාට්‍යයේ ආනුශාංගික අංග සහ 'සිංහල තිත් තාල ක්‍රමය ' ග්‍රන්ථ රචනා කරන ලද්දේ.
    (1) බී. පී. අහුගොඩ මහතා සහ සරත් විජේවර්ධන මහතා විසිනි.
    (2) ලයනල් බෙන්තරගේ මහතා සහ වින්සන්ට් සෝමපාල මහතා විසිනි.
    (3) ජගත් පද්මසිරි මහතා සහ සරත් විජේවර්ධන මහතා විසිනි.
    (4) සී. ද. එස්. කුලතිලක මහතා සහ වින්සන්ට් සෝමපාල මහතා විසිනි.
    (5) බී. පී. අහුගොඩ මහතා සහ වින්සන්ට් සෝමපාල මහතා විසිනි. (.........)

02. ' වීරමුන්ඩ දෙවි වඩින්ඩ සියළු දෝස දුරහරින්ඩ' මෙම කවිය අයත් වනුයේ,
    (1) කොහොඹා හැල්ලට ය. (2) මඩුපුරයට ය.
    (3) කුවේණි අස්නෙට ය. (4) උඟුරා යක්කමට ය.
    (5) කෝල්මුර ගායනා වලට ය. (.........)

03. 'ගත ගුම් ර් ...රිම් ගත ගදිගත ගදිත ගතම් ' ..........බෙර පදයට අනුව සභාගත වන්නේ,
    (1) ජසයා ය. (2) පණික්කලේ ය. (3) පරයා ය. (4) මුදලි ය.
    (5) ආරච්චි ය. (.........)

04. ' කඩ තරිකිට කුං දාං කඩතක' ... මෙම අඩව්ව නර්තනය කරන තාල රූපය හා වට්ටම වනුයේ,
    (1) මාත්‍රා 3 + 3 තාල රූපයට කුඳකුජිගත වට්ටම
    (2) මාත්‍රා 2 + 3 තාල රූපයට දොංජිංතගතදොංත වට්ටම
    (3) මාත්‍රා 2 + 2+2+4 තාල රූපයට ගොග්ගොග් ජිං ජිංගත වට්ටම
    (4) මාත්‍රා 2 + 2+4 තාල රූපයට කුදාංත ගත දොං වට්ටම
    (5) මාත්‍රා 2 + 4 තාල රූපයට කුදාංත ගත දොං වට්ටම (.........)

05. ' ධින ධිධින තින ධිධින' මෙම ඨෙකාවට අයත් තාලයට සමාන දේශීය තාල රූපය වන්නේ,
    (1) මාත්‍රා 2 + 3 (2)මාත්‍රා 3 + 3 (3) මාත්‍රා 3 + 4 (4) මාත්‍රා 4 + 4
    (5) මාත්‍රා 2 + 4 (.........)

06. 'තාලඃ කාල ක්‍රියා මානම්' ලෙස තාලය පිළිබඳ අර්ථකථනය ඉදිරිපත් කරන ලද්දේ,
    (1) සාරංග දේව පඬිතුමා (2) අභිනව ගුප්ත ආචාර්යයන්
    (3) නන්දිකේෂ්වර පඬිතුමා (4) අමරසිංහ ආචාර්යයන්
    (5) බරත මුණි පඬිතුමා (.........)

07. වානරයෙකුගේ මුහුණට සමාන වෙස් මුහුණක් පැළඳ සභාවට පිවිසෙන්නේ,
(1) කළු යකාගේ චරිතය යි
(2) රීරියකාගේ චරිතය යි
(3) නොංචි චරිතය යි
(4) ජසයා ගේ චරිතය යි
(5) ලෙංචිනාගේ චරිතය යි (.........)

08. තාලයේ මූලධර්ම පිළිබඳ කථා කිරීමේදී කවර හෝ තාලයක් ප්‍රදර්ශනය කරන අවස්ථාවකදී මතුවන ස්වභාවය හඳුන්වන්නේ
(1) මිතිය ලෙසය (2) ගතිය ලෙස ය (3) ජාති ලෙස ය (4) ආඝාත ලෙස ය
(5) ලය ලෙස ය (.........)

09. කොහොඹා කංකාරිය ශාන්තිකර්ම යේ සියළුම යක්දෙස්සන් විසින් ඉදිරිපත් කරනු ලබන දෙවෙනි නර්තන අංගය වන්නේ,
(1) යක්කැනුම ය. (2) කොහොඹා හැල්ලය. (3) කුවේණි අස්නය.
(4) ආවැන්දුම ය. (5) මඩුපුරය ය. (.........)

10. ' තා තෙයි තා තෙයියත් තාම් ' මෙය උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ වලට අයත්,
(1) නුහුරු අඩිය යි (2) පසුපෙර අඩිය යි
(3 තුන්පැති අඩිය යි (4) කරණම් අඩිය යි
(5) චක්‍ර අඩිය යි (.........)

11. ගැටබෙරය සකස් කිරීමේදී බෙරකඳ හැරීම ආරම්භ කරන්නේ....
(1) දෙට නැකතේ සුභ මුහුර්තයට අනුව ය.
(2) අස්විද නැකතේ සුභ මුහුර්තයට අනුව ය.
(3) කැති නැකතේ සුභ මුහුර්තයට අනුව ය.
(4) රෙහෙන නැකතේ සුභ මුහුර්තයට අනුව ය.
(5) බෙරණ නැකතේ සුභ මුහුර්තයට අනුව ය. (.........)

12. සබරගමු නර්තන සම්ප්‍රදායේ මණ්ඩිපද හා දොඹිනපද නැටීමෙන් පසුව ආධුනිකයකු විසින් නටනු ලබන මුල්ම නර්තන අංගය වන්නේ.
(1) මංගලම් ය (2) ශුද්ධ මාත්‍රය (3) මුල් මාත්‍රය ය (4) කෙණ්ඩි පාළිය ය
(5) පද නැටීමය (.........)

13. සිංහල හටන් අලලා අලගියවන්න මුකවෙටි කවියා පළමුව ලියන ලද හටන් කාව්‍යය වන්නේ,
(1) දුණු විල හටන (2) පරංගි හටන (3) ඉංග්‍රීසි හටන (4) මුල්ලේරියා හටන
(5) ඇහැළේපොල හටන (.........)

14. සබරගමු නර්තන සම්ප්‍රදායේ ' හාතායක්කම ' පෙළපාළිය අංගයේ ආශිර්වාද කවි ගායනයේදී භාවිතා කරන වාද්‍ය භාණ්ඩයකි,
(1) පන්තේරුව (2) තාලම්පොට (3) හොරනෑව (4) පොකුරු බෙරය
(5) උඩැක්කිය (.........)

15. දෙවන පරාක්‍රමබාහු රජුගේ මාළිගයට යාබද නාට්‍ය ශාලාවක් පැවති බව සඳහන් ග්‍රන්ථය වන්නේ,
(1) ථූප වංශය (2) කව් සිළුමිණ (3) කඳවුරු සිරිත (4) දඹදෙණි අස්න
(2) සද්ධර්ම රත්නාවලිය (.........)

16. ශාන්ති කර්ම වලදී වෙස් මුහුණු භාවිතා නොකර අංග රචනා ක්‍රමවේද භාවිතයෙන් ඉදිරිපත්කරන චරිත සඳහන් වරණය වන්නේ,
(1) වඩිග පටුන , අතුපාළිය (2) සළුපාළිය, වෙඩි සන්නිය
(3) මරු සන්නිය, ගොලු සන්නිය (4) කළුයකා, අමුක්කු සන්නිය
(5) අතුපාළිය, ධූපපාළිය (.........)

17. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ගේ රාජ සභාව ආශ්‍රිත කවිකාර මඩුව තුළින් උඩරට දහඅට වන්නම් රචනා වූ සියවස වන්නේ,
(1) 19 වන සියවස (2) 18 වන සියවස
(3) 14 වන සියවස (4) 16 වන සියවස
(5) 15 වන සියවස (.........)

18. කථක් නර්තනයේ ප්‍රවර්ධනයට දායකවූවන් ලෙස දැක්වෙන්නේ,
(1) අච්ඡන් මහාරාජ් හා ජිනදාස වික්‍රමසිංහ ය.
(2) වල්ලතෝල් නාරායන හා ජීන් ජෝර්ජ් නොර්වේ ය.
(3) iv වෙනි ලුවී රජු හා කැතරින් ඩි මෙඩිසි ය.
(4) මහා අක්බාර් රජු හා රවීන්ද්‍රනාත්තාගෝර් ය.
(5) නවාබ් වජිද් අලිෂා හා වල්ලතෝල් නාරායන මෙනන් ය. (.........)

19. ' පනිඳු දෙති සෙතා සුන් සුන් කර දොස මෙඔබට සෙත් දෙතා ' මෙම කවි පදයෙහි සඳහන් ග්‍රහයා නම්,
(1) කේතුය (2) රාහු ය (3) සිකුරු ය (4) කුජය (5) බුධ ය (.........)

20. වී පෙළීම හා ගොයම් කැපීම නිරූපණය කෙරෙන ද්‍රවිඩ ගැමි නැටුම් දෙකකි,
(1) කෝලාට්ටම් සහ අරිච්චෙට්ටු (2) සුලකු සහ චෙම්බු
(3) චෙම්බු සහ අරිච්චෙට්ටු (4) සුලකු සහ අරිච්චෙට්ටු
(5) කුම්මි සහ සුලකු (.........)

21. මණිපුරි නර්තන සම්ප්‍රදායේ ප්‍රභවයට හේතු වූ කථා පුවතෙහි අන්තර්ගත රජු වන්නේ,
(1) මහා අක්බාර් ය. (2) මහා පීටර් ය. (3) සැමොරින් ය.
(4) කොට්ටාරක්කාර තාම්පුරම් ය. (5) රාජා කාර්තා ය. (.........)

22. ' බලි බෙර ' යන්නට වඩාත් නිවැරදි වරණය වන්නේ
(1) පහළ හඬකින් බෙරපද වැයීම ය (2) ඉහළ හඬකින් බෙරපද වැයීම ය
(3) හඬ පාලනය කොට බෙරපද වැයීම ය (4) බලි ශාන්තිකර්ම වල බෙර පද වැයීමය
(5) නිවැරදි අක්ෂර සහිතව බෙරපද වැයීම ය. (.........)

23. භරත හා කතක් නර්තන සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ පිළිවෙලින් වන්නේ,
(1) තමිල්නාඩුව හා මහාරාෂ්ටය (2) තාන්ජෝරය හා කේරළය
(3) ගුජරාටය හා ඉම්පාල් ය (4) තමිල්නාඩුව හා දිල්ලි
(5) මලබාරය හා තමිල්නාඩුව (.........)

24. ' අක්ක ඉතින් නාඩන්නේ ', මෙම කවි පදයෙහි ලඝු හා ගුරු මාත්‍රා ගණන වන්නේ,
(1) ලඝු මාත්‍රා 3ක් හා ගුරු මාත්‍රා 5 යි (2) ලඝු මාත්‍රා 2ක් හා ගුරු මාත්‍රා 5 යි
(3) ලඝු මාත්‍රා 3ක් හා ගුරු මාත්‍රා 3 යි (4) ලඝු මාත්‍රා 2ක් හා ගුරු මාත්‍රා 4 යි
(5) ලඝු මාත්‍රා 5ක් හා ගුරු මාත්‍රා 2 යි (.........)

25. ගණ දෙවියන් හා මුරුගන් දෙවියන් උදෙසා ඉදිරිපත් කරන ගැමි නැටුම් දෙකකි,
(1) කරගම් හා කෝලට්ටම් (2) කුම්මි හා සුලකු (3) කරගම් හා සුලකු
(4) කරගම් හා කාවඩි (5) කොළඳු පරිතාල් හා කාවඩි

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. සත්සති, පන්සාලිස් වස, සුවිසි විවරණ අවස්ථාවලදී ...................................................... නැටුම සුවිශේෂී ස්ථානයක් ගනී.

27. නිශ්ශංක මල්ල රජ තුමාට ............................................... ශාන්තිකර්මයක් කළ බව චූලවංශයේ සඳහන් වේ.

28. පත්තිනි දේවිය ද්‍රවිඩ ජන සමාජයේදී ........................................... නමින් පුද පූජා වලට පාත්‍ර වී ඇත.

29. මෝල්ගස් නැටුම ...................................................... දශකයේ මිරැන්ඩා හේමලතා මිය විසින් නිර්මාණය කරන ලද්දකි.

30. සමනළ වන්නම ......................................................................... විසින් රචනා කරන ලදී.

31. සීතා බිසව ගේ දරුවන් තිදෙනා කොහොඹායක් කංකාරියේදී .......................................... නමින් හඳුන්වයි.

32. පටාචාරා කලාකෘතිය ........................................................ වසරේදී නිර්මාණය වූවකි.

33. කර්ණාටක තාල පද්ධතියේ මිශ්‍ර ජාති, ඒක තාල දේශීය තාල පද්ධතියේ .............................................. දෙතිතට සමානය.

34. ක්‍රෝධ නැමති ස්ථායි භාවයෙන් ................................................................... රසය උපදී.

35. ශුද්ධ මාත්‍රයේ බෙරපදය භාවිතා කරන අවස්ථාවක් ලෙස .............................................. කෝලම දැක්විය හැකිය.

- **අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉර මත ලියන්න.**

36. බෙර වාදනයේ දී ධ්වනි නිෂ්පත්තියට අනුව අවනද්ධාක්ෂර කොටස් දෙකකි. එය නම් කරන්න.

    1. ..................................................... 2. .....................................................

37. ගොපලු කුරුම්බර හා රොඩී බිසව පුද ලබන ශාන්ති කර්ම දෙක නම් කරන්න

    1. ගොපලු කුරුම්බරඃ .................................... 2. රොඩී බිසව ඃ.................................................

38. කුවේණි අස්න නර්තනයේදී යක්දෙස්සන් විසින් දෙඅතට ගනු ලබන රංග උපකරණ නම් කරන්න

    1. .................................................. 2. ....................................................

39. හාස්‍ය සහ කරුණා රසයට අදාළ භාවයන් නම් කරන්න

    1. හාස්‍ය ඃ............................................... 2. කරුණා ඃ............................................

40. වළියක්මංගල්‍යය ශාන්තිකර්මයේ යක්දෙස්සන්ගේ ප්‍රධාන ඇඳුම් කට්ටලය සහ හිස් පළඳනාව නම් කරන්න.

    1. ඇඳුම් කට්ටලය ඃ.....................................................................

    2. හිස් පළඳනාව ඃ .....................................................................

41. රූප සටහනෙහි දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාළිය හා අදාළ ශාන්තිකර්මය නම් කරන්න.



    1. නාට්‍යමය පෙළපාළිය.......................................

    2. ශාන්තිකර්මය..................................................

42. උඩැක්කියෙහි සම්මත දිග සහ ඇසෙහි විශ්කම්භය කොපමණ ද?

1. දිග : ............................................ 2. ඇසෙහි විශ්කම්භය : .......................................

43. මගුල් ප්‍රස්ථාව, බැරිසිල් මෙම නාට්‍යයන්ට අදාළ නාට්‍ය ශෛලිය නම් කරන්න.

1. මගුල් ප්‍රස්ථාව :..................................... 2. බැරිසිල් : .................................................................

44. භරත නාට්‍යයම් හා කථකලි නර්තන සම්ප්‍රදායන් උගන්වන ආයතන දෙකක් නම් කරන්න.

1. භරත නාට්‍යයම් : ........................................ 2. කථකලි : .........................................................


45. ' තුන් මස් තුන් පෝයක් වැදි හිරලයක්.........මෙම සංවාදය අන්තර්ගත නාට්‍යමය පෙළපාලිය හා ශාන්ති කර්මය නම් කරන්න.

1. නාට්‍යමය පෙළපාලිය : ..........................................

2. ශාන්ති කර්මය : ..................................................

46. ' කුංජිං කඩතකු තකුජිං කඩතකු තකු ජිං ජිං ' මෙම අලංකාර බෙර පදයට අදාළ තාල රූපය හා වන්නම ලියා දක්වන්න.

1. තාල රූපයː .......................................... 2. වන්නම :.......................................................



A



B

47. ඉහත A හා B රූප සටහන් හි දැක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

1. A - ....................................................... 2. B - ..............................................................

48. ' ගම්බිර කාලිංග නුවර නිරිඳුගෙ රජ වාසලයට ' මෙම කවිය ගයමින් රඟ දක්වන චරිතය හා එය අයත් ගැමි නාටකය නම් කරන්න.

1. චරිතය : ................................................ 2. ගැමි නාටකයː ....................................................

49. රස භාව සංකල්පයට අදාළ විභාව කොටස් දෙක නම් කරන්න.

1. ...................................................... 2. ..................................................................

50 පහත දැක්වෙන චාරිත්‍රවිධි සිදු කරන්නේ කුමන ශාන්තිකර්මවල දී ද?

1. කීල බැඳීමː ...........................................................................................

2. කිරි කොරහා ළිප තැබීම : ................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 12 - 2023**

විභාග අංකය: ....................................

# 52 - නර්තනය ( දේශීය ) - II

කාලය පැය 03 යි
අමතර කාලය වි. 10කි.

- **I** - කොටසේ ප්‍රශ්න දෙක අනිවාර්ය වේ.
- **II** හා **III** - කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් අතුළත් වනසේ ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- උපදෙස් :- සෑම ප්‍රශ්නයකම I හා II කොටසට ලකුණු 06 බැගින් ද, III කොටසට ලකුණු 08 බැගින්ද ලකුණු 20ක් හිමිවේ.

---

## I - කොටස

01. (i) පහත සඳහන් බෙර පදය අදාල තාල රූපයට ප්‍රස්තාර කරන්න.

‘දොං තකු දොං ජිංතක තරිකිට’

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

‘ ඒ බුදු රැස් කඳ තුන් ලොව විහිදූ
ඒ'බුදු මඟුලට ආ සැම දෙවිදූ ’

(iii) මුසලඩි වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න.

02. දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමේදී ලිඛිත හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වඩාත් වැදගත් වේ.

(i) පොළොන්නරු යුගයේ නර්තන කලාව පැවති තත්වය පිළිබඳව පුරාවිද්‍යාත්මක සධක දෙකක් ඇසුරෙන් විමසීමක් කරන්න.

(ii) අනුරාධපුර යුගයේදී ආගමික උත්සව සඳහා නර්තනය භාවිතා කල බවට සාධක දෙකක් මගින් පැහැදිලි කරන්න.

(iii) කුරුණෑගල යුගයේ තූර්ය භාණ්ඩ භාවිතා කළ බවට හා නර්තන කලාව පැවති බවට සාධක දෙකක් ගෙන විග්‍රහ කරන්න.

## II - කොටස

03. ශාන්තිකර්ම තුළින් සමාජ සහජීවනය සහ දේශීය සංස්කෘතික ලක්ෂණ විදහා පායි.

(i) වලියක් මංගල්‍යයේ සැරසිලි 2ක් නම් කර ඒ පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 06)

(ii) රටයකුම ශාන්ති කර්මයේ පුරාවෘත්තය හා බැඳි සාරධර්ම පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 06)

(iii) ''බලිශාන්තිකර්මය විවිධ ගායනාවලින් පරිපූර්ණ වූවකි'',නිදසුන් සහිතව විස්තර කරන්න(ල. 08)

04 ශාන්තිකර්ම පිළිබඳ අධ්‍යයනයේදී ඒවාට ආවේණික වූ විවිධ ලක්ෂණ දක්නට ලැබේ.

(i) කිරිමඩු ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි 4ක් නම් කර ඒ පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 06)

(ii) වලියකුම ශාන්තිකර්මයේ ගායන, වාදන, නර්තන රංග වස්ත්‍ර පිළිබඳ ඇගයීමක් කරන්න.(ල. 06)

(iii) ''පොත්කඩේයක්කම'' යන නාට්‍යමය අවස්ථාවේ සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරන්න. (ල. 08)

05. ගැමි නැටුම් හා ගැමි නාටක සමාජයේ ජීවන රටාව විවරණය කරන්නකි.

(i) ගැමි නැටුමට ආවේනික සුවිශේෂ ලක්ෂණ මෙන්ම ඒ හා බැඳි ගායනා වලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹුවේ. නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ii) සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතිකාංගවල සමාන තා ඇති බව ජන නැටුම් දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(iii) සමාජ විවරණය සඳහා කෝලම් නාටක චරිත ඉවහල් කොටගෙන ඇති ආකාරය නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

## III - කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ), (ඉ) යන කොටස් වලට අදාලව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ශ්‍රීමතී මේනකා | නිදිකුමරිය | රාස්ලීලා |
| බාල සරස්වතී | පටාචාරා | අලාරිප්පු |
| රුක්මණී අරුන්ඩේල් | නට්ක්‍රැකර් | රාමාට්ටම් |
| කැතරින් ඩී මෙඩිසි | රන්දද | පරන් |

(i) (අ) කොටස - අඩියාර්හි කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කල ශිල්පිනිය නම් කර ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ii) (ආ)කොටස - දේශීය මුද්‍රා නාට්‍ය කෘතිය තෝරාගෙන එහි රංග වස්ත්‍රාභරණ හා පසුතල නිර්මාණ පිළිබඳ ඇගයීමක් කරන්න.

(iii) (ඉ) කොටස - කථකලි නර්තන සම්ප්‍රධායට අයත් නෘත්‍ය නාටකය නම්කර එම නර්තන සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳ විමසීමක් කරන්න.

07. අනුෂාංගික අංගවල සුසංයෝගයෙන් නර්තනයක භාව සිදු වේ.

(i) චිත්‍ර කලාව හා බැඳි මූලිකාංග නර්තන කලාව හා සුසංයෝග වන ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ii) බලි ශාන්ති කර්ම ශිල්පියා තුළ ඇති චිත්‍ර කලාව පිළිබඳ ශිල්පීය කුසලතාවය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(iii) නර්තන කලාවේ පෝෂණයට සුභාවිත සංගීතය නවාංගයක් ලෙස එකතු වී ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

08. රූපවාහිණී මාධ්‍ය ආයතන ප්‍රචාරය කරන නර්තන වැඩසටහන් නැරඹීම අද්‍යතන ප්‍රවණතාවයකි.

(i) රූපවාහිණී මාධ්‍ය ඔස්සේ දක්නට ලැබෙන වැඩසටහන් නම්, කර නර්තන වැඩසටහන් සංවිධානය නර්තන කලාවේ ප්‍රගමනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) රූපවාහිණී නර්තන නිර්මාණ කරනය සඳහා රංග වස්ත්‍රාභරණ හා අංග රචනය භාවිතා කිරීම පිළිබඳව විමසුමක් කරන්න.

(iii) රූපවාහිණියෙන් ඉදිරිපත් කෙරෙන නර්තන තරගාවලි මගින් යහපත් හා අයහපත් ප්‍රතිඵල සිදු වේද? විචාරයට ලක් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2023

**12 ශ්‍රේණිය** **52 - නර්තනය ( දේශීය)** **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (2) | 03. (4) | 04. (4) | 05. (1) | 06. (4) | 07. (2) | 08. (2) | 09. (3) | 10. (1) |
| 11. (2) | 12. (3) | 13. (2) | 14. (5) | 15. (3) | 16. (1) | 17. (2) | 18. (1) | 19. (2) | 20. (4) |
| 21. (5) | 22. (3) | 23. (1) | 24. (2) | 25. (4) | | | | | |

26. පන්තේරු 27. බලි 28. කන්නගි 29. 1980
30. ශ්‍රී වජ්‍රරත්න මානවසිංහ 31. මළය රාජ තුන්කට්ටුව 32. 2013 33. මැදුම් මහ
34. රෞද්‍ර 35. අණබෙර 36. I. සංයුක්තාක්ෂර II. ශුද්ධාක්ෂර

| | | | | |
|---|---|---|---|---|
| 37. | I. | කිරි මඩුව | II. | රටයකුම |
| 38. | I. | හී ගස | II. | පොල්පන්දම |
| 39. | I. | හාස | II. | ශෝක |
| 40. | I. | වෙස් ඇදුම් කට්ටලය | II. | සිවිලිය |
| 41. | I. | නානුමුරය | II. | රටයකුම |
| 42. | I. | එක්වියත් තුනගුලකි | II. | අගල් පහමාරකි |
| 43. | I. | තාත්වික නාට්‍ය | II. | මුද්‍රා නාට්‍ය |
| 44. | I. | අඬියාර්හි කලා ක්ෂේත්‍රම් | II. | කේරළ කලා මණ්ඩලම් |
| 45. | I. | ඌරා යක්කම | II. | කොහොඹායක්කංකාරිය |
| 46. | I. | 2+2+3 | II. | මයුරා වන්නම |
| 47. | I. | භරත | II. | මණිපූරි |
| 48. | I. | ජසයා | II. | කෝලම් |
| 49. | I. | ආලම්බන | II. | උද්දීපන |
| 50. | I. | වලියකුම ශාන්තිකර්මය | II. | කිරිමඩුව ශාන්තිකර්මය |

ලකුණු ප්‍රදානය ඃ
එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 ට = 02 x 50 මුළු ලකුණු = 100

## II පත්‍රය -I කොටස

01. (i) පහත සඳහන් බෙර පදය අදාළ තාල රූපයට ප්‍රස්තාර කරන්න.
'' දොං තකු දොං ජිංතක තරිකිට''

| ^ | | ^ | | ^ | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දොං | - | ත | කු | දොං | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |

නිවැරදි විභාග වලට වෙන් කිරීම හා සංකේත භාවිතයට - ලකුණු - 02
බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු - 04 මුළු ලකුණු - 06

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
'' ඒ බුදු රැස් කඳ තුන් ලොව විහිදූ
ඒ බුදු මඟුලට ආ සැම දෙවිඳූ''

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | ඒ | බු | දු | රැස් | - | ක | ඳ | - | - | - | - |
| + | තුන් | ලො | ව | වි | හි | දූ | - | - | - | - | - |
| + | ඒ | බු | දු | ම | ඟු | ල | ට | - | - | - | - |
| + | ආ | සැ | ම | දෙ | වි | ඳූ | - | - | - | - | - |

නිවැරදි විභාග වලට වෙන් කිරීම හා සංකේත භාවිතයට - ලකුණු - 02
බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු - 04 මුළු ලකුණු - 06

**III** මුසලඩි වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න.

කස්තිරම

| | | | |
|---|---|---|---|
| ^<br>1 2 3 | /<br>1 2 3 4 | ^<br>1 2 3 | /<br>1 2 3 4 |
| රැ ද ග<br>තග් - ග<br>රැ ද ග<br>රැ ද ග<br>තග් - ග | ජිත් - ත ක<br>ජිත් - ත ක<br>ජිං - ජිං -<br>ජිත් - ත ක<br>ජිත් - ත ක | ත ක ට<br>ත ක ට<br>රැ ද ග<br>ත ක ට<br>ත ක ට | කුං - දත් -<br>කුං - දත් -<br>ජිං - ජිං -<br>කු ඳ කු ඳ<br>කුං - දත් - |
| ^<br>1 2 3 | /<br>1 2 3 | ^<br>1 2 3 | /<br>1 2 3 |
| ජිං කඩ තක<br>ජිං කඩ තක<br>ජිං කඩ තක | ජිං කුකු තක<br>ජිං කුකු තක<br>ජිං කුකු තක | ජිං කඩ තක<br>ජිං කඩ තක<br>ජිං කඩ තක | ජිං කුකු තක<br>ජිං කුකු තක<br>ජිං කුකු තක |
| ^<br>1 2 3 | /<br>1 2 3 4 | ^<br>1 2 3 | /<br>1 2 3 4 |
| රැ ද ග<br>තග් - ග<br>රැ ද ග<br>දෝං - - | ජිත් - ත ක<br>ජිත් - ත ක<br>ජිත් - ත ක<br>තා | ත ක ට<br>ත ක ට<br>ත ක ට | කු ද කු ද<br>කුං - දත් -<br>කුං - දත් - |

නිවැරදි විභාග වලට වෙන් කිරීම හා සංකේත භාවිතයට - ලකුණු - 02
බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු - 06 මුළු ලකුණු - 08

(6 + 6 + 8 = 20)

(02) (i) පොළොන්නරු යුගයේ නර්තන කලාව පැවති තත්වය පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක දෙකක් ඇසුරෙන් විම සීමක් කරන්න.

- ⋆ 12ස් වන ශත වර්ෂයට අයත් පරාක්‍රමබාහු කුමාරයා උපන් ස්ථානය ලෙස සැලකෙන දැදිගම සුතිඝර චෛත්‍යයෙන් හෙවත් කොටවෙහෙරෙන් සොයාගත් ඇත් පහනෙහි නර්තන වාදන පෙ න් නු ම් කරන සාධකය.
- ⋆ පාල මොට්ටායි ශිලා ලේඛනයට අනුව දේව දාසීන් සිටි බවත්, ඔවුන් උදෙසා පූජා නැටුම් නැටූ බවත්, නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත් දෙනෙකු පිදූ බවත්, ඔවුන්ට තැන්පත් කළ මුදලක පොළියෙන් මාස්පතා කාසි ගෙවූ බව සඳහන් සාධකය ... ආදී සාධක හෝ වෙනත් පුරා විද්‍යාත්මක සාධක තුලින් පිළිතුරු ලියා තිබීමට

(සාධක දෙකක් ලියා තිබීමට ලකුණු - 02
ඒ ඇසුරෙන් විමසීමක් කර තිබීමට ලකුණු -04 මුළු ලකුණු 06 යි.

(ii) අනුරාධපුර යුගයේදී ආගමික උත්සව සඳහා නර්තනය භාවිත කල ආකාරය සාධක දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න.

- ⋆ අනුරාධපුර යුගය හඳුන්වා තිබීම
- ⋆ රුවන්වැලි මහා සෑයේ ධාතු නිධානෝත්සවයට දුටුගැමුණු රජතුමා දහසය දහසක් නළගනන් පිරිවරාගෙන මහ පෙරහරින් තූර්ය නාදය හා බෙර වයමින් ගිය වග සාධකය.
- ⋆ දුටු ගැමුණු රජු මහා සෑයේ ධාතු නිධානෝත්සවයේදී පූජාකල වස්තු අතර නිළිරූපයක් ද වූ වග
- ⋆ භාතිකාභය රජු සමයේ ඒ මිහිපති තෙමේ වසරක් පාසා අඛණ්ඩව මහ බෝධිය බෝධි ස්නාන පූජා මහා චෛත්‍යයේ විවිධාකාර වූ නැටුම් පිළිබඳව කියැවෙන සාධකය.
- ⋆ දුටු ගැමුණු රජු දා ගැබ බඳින ස්ථානයට පෙරහැරින් යැම පිළිබඳ විස්තරයෙන් 16000ක් නළගනන් සැරසුණ ආකාරය පිළිබඳව කියැවෙන සාධකය හෝ අදාල සාධක දෙකක්

ලියා තිබීමට ලකුණු - 02
ඒ ඇසුරෙන් විමසීමක් කර තිබීමට ලකුණු - 04
ලකුණු 06 යි.

(iii) කුරුණෑගල යුගයේ තූර්ය භාණ්ඩ භාවිතා කළ බවට හා නර්තන කලාව පැවති බවට සාධක දෙකක් ගෙන විග්‍රහ කරන්න.

- ★ සිංහල ථූප වංශයෙහි ගැටබෙර, පනා බෙර, එකැස් බෙර, මිහිගුබෙර, මද්දල .....භෘංග වීණා, නකුල වීණා, දද්දර වීණා ආදී භේරි නාදයෙන් ..........යනුවෙන් සාධකය හෝ වෙනත් තූර්ය භාණ්ඩ කල බවට සාධකයක් ලියා තිබීම
- ★ කුරුණෑගල රිදී විහාරයේ දොරෙහි ඇති ඇත්දත් කැටයම් වල නළඟන රූප තිබීම තුළින් එවකට නර්තන කලාව පැවති බවට සාධකය ලියා තිබීම හා ඒ තුලින් විග්‍රහකර තිබීම.

සාධක ලියා තිබීමට ලකුණු - 02
ඒ ඇසුරෙන් විමසීමක් කර තිබීමට ලකුණු - 06
ලකුණු 08 යි.

මුළු - ලකුණු 6 + 6 + 8 = 20 යි.

## II කොටස

(3) I ★ නානුමුරයේ රූපණ අවස්ථා ඉස්මතු වී ඇති ආකාරය විස්තර කිරීම.

- ★ ඇදුරා රිද්දි බිසවුන්ගේ සමාරෝපය වෙමින් නානුමුරයේ අවස්ථා අනුකරණාත්මකව ඉදිරිපත් කිරීම.
- ★ කාන්තාවකගේ භාවාත්මක හැඟීම් උද්දීපනය කරන අයුරින් නාරි ලාලිත්‍යයෙන් නර්තන ඉදිරිපත් කිරීම. උදා: හිස පීරීම, නානු ගෑම, සළු පැළඳීම..........
- ★ රංගභාණ්ඩ කලාත්මකව සකස් කිරීම සිදුකරන බවත්, එය ශිල්පියාගේ කලා හැකියාමත සිදුවන බවත් දැක්වීම. කරුණු 3ක් ඔස්සේ ඇගයීමට ලක්කර ඇත්නම් - ලකුණු 06

II ★ විවිධ කුලගෝත්‍ර අනුව ඌරාගේ කොටස් බෙදන ආකාරය කවි වලින් උදාහරන දක්වා තිබීම.

- ★ බෙරපද, කවිගායනා මගින් නාට්‍යමය අවස්ථාවක් ලෙස ඉදිරිපත් වන බව ආදී ලෙස. කළගුණ සැලකීම පිළිබඳව ඇතුලත්ව උදාහරණ දෙමින් කරුණු දක්වා ඇත්නම් - ලකුණු 06

III ★ ප්‍රධාන ඇඳුරා සහ දවුල් වාදකයා අතර සංවාද මගින් නාට්‍ය රසය ඉස්මතු වන බව.

- ★ බුලත් සහ බැදි සිද්ධියක් හාස්‍යයෝත්පාදකව ඉදිරිපත් කර බව.
- ★ ගොයම හා සම්බන්ධ රෝග ස්ත්‍රීන්ට වැළදෙන රෝග බව ප්‍රකාශ වීමෙන් හාස්‍ය රසය තව තවත් උද්දීපනය කෙරෙන බව. විස්තර කර ලියා ඇත්නම් ලකුණු 08

(4) I ★ සාමූහිකත්වයෙන් සහ සහයෝගයෙන් ගමේ පොදු යහපත උදෙසා එකමුතුව වැඩ කරන බව.

- ★ කිරි ඉතිරිවීම මූලිකව කෙරෙන බව.
- ★ කිරි උතුරුවා ගව පට්ටි වලට ඉසීමෙන් සෞභාග්‍ය ළඟාකර ගත හැකි යයි විශ්වාස කරන බව.
- ★ නාට්‍යානුසාරයෙන් කුඹුරු කෙටීමේ සිට අස්වනු නෙළීම දක්වා ඉදිරිපත් කරන බවත් එම සහලින් දෙවියන්ට දානය දීමෙන් සශ්‍රීකත්වය අපේක්ෂා කරන බවත් දැක්වීම.
- ★ මෙහිදී කිරි රොටි දානයද සුවිශේෂී අවස්ථාවක් බව.
- ★ පැමිණි සියළුම දෙනාට රොටී පිළිගැන්වීමෙන් සාමූහිකත්වය, සහජීවනය, සමගිය හා උස්පාත් භේදයකින් තොරව සියළුම දෙනා සමව සලකන බව.

ආදී ලෙස කරුණු 3ක් වත් දක්වා ඇතනම් - ලකුණු 06

II ★ කළු යකා, රීරි යකා, සූනියම් යක්ෂණිය හි මුහුණුවල විවිධත්වය හා චරිත නිරූපනයට එය ඉවහල් වන බව.

- ★ සූනියම් යක්ෂණියගේ අවස්ථා 3.

i. තරුණිය ii. ගැබිණි කාන්තාව iii. දරුවා හා මව - ආදි ලෙස විස්තර කර තිබිම.

## II පත්‍රය - II කොටස

(3) I ★ සොලොස්මගල සැරසිල්ල

- ★ රංගභූමිය හරිමැද සහල්වලින් සරසනලද බව
- ★ යොදාගන්නා ද්‍රව්‍ය ( කැකුළු සහල් සේරු 16ක්, මැටි පහන් හා තිර 16ක්, ලෙල්ල රහිත පොල්ගෙඩි 16ක්, පඬුරු 16ක්, ලෙල්ල සහිත පොල්ගෙඩි 04ක්, සුදු නූල් කැරැල්ලක් අඩි දෙක තුනක ලීකොට 04ක් ආදි ලෙස)
- ★ '' මැද පෙති පසෙක වට රුස්තරු වල්ලා''.... යන කවිය දක්වා සොළොස්මගල සකස් කරන ආකාරය විස්තර කර ඇත්නම්
  - සිවිලි වලං
    කුඩා මුට්ටි 12ක් මත නිල් රෙදි කඩක් අතුරා සරසන බව, විවිධ වර්ණ මල්, සුවඳ වර්ග, පඬුරු ඒ මත තබන බව
  - මුවමල / ගවරමල
- ★ රඟමඩල වහලයේ ඇති උඩුවියන අතර හරි මැද කණුවක ආධාරයෙන් බාල්කයෙහි එල්ලා ඇති ගොප් කොළ සහ පොල්මල් සැරසිල්ලක් බව
- ★ පරණි ග්‍රැමපෝනයක හැඩය ඇති බව
- ★ මෙම සැරසිලි තුළින් සශ්‍රීකත්වය අපේක්ෂා කරන බව .....දක්වා තිබීම (ල. 06)

II පුරාවෘත්තය ඇසුරින්

- ★ කළගුණ සැලකීම ★ පිරිසිදුබව ★ ස්වාමිභක්තිය
- ★ ආගමික භක්තිය ආදිය විස්තර කර ඇගයීමක් කර තිබීම (ල. 06)

III අෂ්ඨක ගායන, ග්‍රහපංති, සිරසපාදකවි, කඩතුරාකවි, බලිමඩුපුරය, ඇඹුම් කවි, හිංහතර කවි....ආදි

- ★ එම සුවිශේෂ ගායනා සඳහා විවිධ නාදමාලා භාවිතා කරන බව
- ★ විවිධ තිත් ප්‍රභේදවලට අනුව ගායනා යෙදෙන බව
- ★ ගායනයට මූලික ස්ථානයක් හිමිවන බවත් එයට අනුව චලන සරලව යොදන බවත් දක්වා තිබීම

(4) I තොටපේකිරීම, මංගල දවුල් වාදනය, යහන් දැක්ම, හත්පද පෙළපාලිය, මහතේවතුර කිරිකොරහ ලිප තැබීම, කිරිඉසීම, මුරුතැන් තැබීම, කහරොටි පිදීම ආදිලෙස පූජා විධි නම් කර තිබීම. කිරිමඩු ශාන්තිකර්මය සිදුකිරීමේ අරමුණ, අපේක්ෂාවන් ඉටුකරගැනීමට මෙම පූජා විධි ඉවහල් වන ආකාරය විස්තර කර ඇත්නම්. ( සෞභාග්‍ය, සාමූහිකත්වය, සහයෝගය, සමගිය ආදිය තුළින්) (ල. 06)

II ★ <u>ගායන හා වාදනය</u> උඩරට නර්තන සම්ප්‍රදායට අනුකූලව සිදුවන බව. මල්යහන් කවි, ස්තෝත්‍ර ගායන මගුල්බෙර වාදන පිරිත්හූයේ කවි ආදිය ගායන වාදන සඳහා යොදා ගන්නා බව.

★ <u>නර්තන අංග ලෙස</u>
යක්කම රඟ දක්වන අතර මහ යක්කම පෙළපාලිය මෙහිදී රඟදක්වයි. යක්කම් වලට අමතරව කාලියාම, ගරායකුන් නැටීම, ගුරුගෙමාලාව, ආවැන්දුමේ දොඟරජිංගජිං වට්ටම, මල නැටීම, කීල බැඳීම ආදිය සඳු කෙරෙන බව.

★ <u>රංගවස්ත්‍ර</u>
වලියක් මංගල්‍යයේ යක්දෙස්සන් අඳිනු ලබන්නේ ද වෙස් ඇඳුම් කට්ටලය බවත් එහෙත් හිසට වෙස්තට්ටුව වෙනුවට සිවිලිය නම් වූ විශේෂ හිස්පලඳනාව පලඳින බව දක්වා තිබීම. මෙය වෙස්තට්ටුව මෙන් දෙගුණයකින් යුක්තබව දක්වා තිබීම. සිරසවටාම පලඳිනු ලබන බව දක්වා තිබීම. (ල. 06)

III ★ පොත්කඩේ යක්කම , පොත් කඩේ පාලිය, පොත්කඩේ නමින්ද හඳුන්වන බව, පහන්මඩු ශාන්තිකර්මයේ දළුමුර පෙලපාලියට ප්‍රථමයෙන් සිදුකරන බව.

★ සබරගමු ශාන්තිකර්ම වලට ආවේණික පෙළපාලියක් බව

- ⋆ සුදුරෙදිකඩක් මත තැබූ බුලත් හුරුල්ල පොත්කඩේ නමින් හඳුන්වන බව
- ⋆ නෙල්ලිකොත්තුවා හෙවත් අත් උදව් කරු මෙම පෙලපාලියේ රංගන කාර්යයට උදව්කරන බවත් සංවාද සඳහා සම්බන්ධකර නොගන්නා බව දක්වා තිබීම.
- ⋆ සංවාද සිදුකෙරෙන්නේ ප්‍රධාන ඇඳුරා හා දවුල්වාදකයා අතර බව
- ⋆ සතර අභිනයෙන් වාචික අභිනයට ප්‍රධාන තැනක් දෙමින් සංවාදමය රංගනයක් සිදුකෙරෙන බව
- ⋆ මෙහි සංවාද තුළින් සමාජ සංසිද්ධි උපහාසාත්මකව විවරණය කිරීම හා දෙපිට කැපෙන වචන තුළින් හා හාස්‍යරසය උපදවන අතර ප්‍රේක්ෂකයාට ව්‍යංගාර්ථ සපයමින් හාස්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව දක්වා ඇත්නම්, (ල. 08)

(5) ගැමි නැටුම් හා ගැමි නාටක එම සමාජයේ ජීවන රටාව විවරණය කරන්නකි.

**I** ගැමි නැටුමට ආවේනික සුවිශේෂ ලක්ෂණ මෙන්ම ඒ හා බැඳි ගායනාවලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹුවේ. නිදසුන් මගින් පැහැදිලි කරන්න.

- ⋆ ගැමිනැටුමට ආවේනික සුවිශේෂ ලක්ෂණ ඇතිබව
- ⋆ සාමූහිකව නර්තනයේ යෙදීම
- ⋆ උපකරණ භාවිතය
- ⋆ ජීවන වෘත්තිය හා බැඳි රිද්ම රටා චලන පාදක වී ඇතිබව
- ⋆ සරල බව ...............
- ⋆ ගායන මගින් ගැමි ජනතාවගේ ජීවන රටාව විද්‍යාමාන වනබව
  - ගැමි ඇදහිලි හා විශ්වාස
  - වෘත්තීන් හි සම්භවය
  - සමාජ සහජීවනය

උදා : - ඉර දෙවියන්ගේ ඉරගල ගාවා....................
- උදයට පායන හිරු දෙවියන්ටයි .............
- බෝ අත්තට වැඳ සිරස නමන්නේ............
- ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට .........
- අක්කන්ඩියේ යමු අපි පන් නෙලන්නට..........

සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීමට ලකුණු 03
ජීවන රටාව පිළිබඳ සාකච්ඡා කිරීමට ලකුණු 03
- ලකුණු 06

**II** සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතිකාංගවල සමානතා ඇතිබව ජන නැටුම් දෙකක් ඇසුරින් විමසුමක් කරන්න.

- ⋆ සිංහල ජන නැටුම් - ලීකෙළි . කළගෙඩි, කුළු, ගොයම්
- ⋆ ද්‍රවිඩ ජන නැටුම් - කෝලාට්ටම්, චෙම්බු, සුලකු, අරිච්චෙට්ටු

ජන නැටුම් දෙකක් තෝරා සමානතා පිළිබඳ විග්‍රහකර ඇත්නම් ලකුණු - 06

- ⋆ සිටු මාළිගය මවන්නට රඟබිම මත ඉදිකෙරෙන අඩි 52ක් දිගින් සහ අඩි 18 ක් උසින් යුතු මාළිගා පසුතලය පටාචාරා මුද්‍රානාට්‍යයේ ප්‍රතාපවත් බව පෙන්වීමට කටයුතු කර ඇති බව.

මුද්‍රා නාට්‍ය හඳුනා ගැනීමට ලකුණු 02
රංගවස්ත්‍රාභරණ පසුතල පිළිබඳ විග්‍රහකර ඇත්නම් ලකුණු 04
- ලකුණු 06

**III** කථකලි නර්තන සම්ප්‍රදායට අයත් නෘත්‍ය නාටකය නම්කර එම නර්තන සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳ විමසීමක් කරන්න.

- ⋆ රාමාට්ටම්
- ⋆ කථකලි නර්තන සම්ප්‍රදායයේ කේන්ද්‍රස්ථනය දක්ෂිණ භාරතයේ කේරළ ප්‍රදේශයේ ආරම්භ වූ බව
- ⋆ 17 වන සියවසේ කථකලි නර්තනය ආරම්භ වූ බව
- ⋆ කථකලි නර්තනයේ මූලික පදනම ආගමික පසුබිම බව
- ⋆ සාහිත්‍ය, චිත්‍ර කලාව, රංගනය සහ නැටුම් යන අංගයන්හි සුවිශේෂී සුසංයෝගයකින් කථකලි නර්තනය ගොඩනැගී ඇති බව
- ⋆ කථකලි දේවාල ආශ්‍රිතව ආවතේව කළ චක්තියාර් බ්‍රාහ්මණයන්ගේ නෘත්‍ය නාට්‍ය පූජා විධි ආශ්‍රිතව ගොඩනැගී ඇති බව

★ මහා භාරතයේ එන ක්‍රිෂ්ණගේ චරිතය පදනම් කරගෙන ක්‍රිෂ්ණාට්ටම්ද රාම චරිතය මුල්කරගෙන රාමාට්ටම් රචනා වී ඇති බව
★ කැලිකට් හී ජැමොරින් රජු හා කොට්ටාරක්කාරයේ තාම්පුරම් රජු මේ සඳහා අනුග්‍රහය ලබා දී ඇතිබව
★ වල්ලතෝල් නාරායන මෙනන් කේරළයේ පැවැති නෘත්‍ය නාටක ඇසුරින් විධිමත් සම්ප්‍රදායක් ලෙස කථකලි නර්තන සම්ප්‍රදාය ගොඩනැගී ඇතිබව

නම් කිරීමට ලකුණු 02
කරුණු 4ක්වත් ලියා ඇත්නම් ලකුණු 06
- ලකුණු 08

(6) **I** අඩියාර්හී කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කළ ශිල්පිනිය නම්කර ඇය පිළිබඳ ඇගයිමක් කරන්න
★ රුක්මණි අරුන්ඩේල්
★ ඇනාපැව්ලෝවාගෙන් බැලේ නර්තන කලාව ඉගෙන ගන්නා ලදබව
★ ගෞරී අම්මාන් වෙතින් නර්තනය ඉගෙනුම ලබා ක්‍රි. ව. 1936 දී චිදම්බරම් දේවාලයේ නටරාජා වෙනුවෙන් පූජා නර්තනයන් ඉදිරිපත් කළබව.
★ භාරත නර්තනය ඉගැන්වීම සඳහා අඩියාර්හි කලා කේෂත්‍ර නමින් ආයතනයක් ආරම්භ කළබව
★ 1956 දී " පද්මභූෂණ " සම්මානයෙන් පිදුම් ලැබුබව
★ රාධා ක්‍රිෂ්ණා. රාම් ලීලා වැනි නෘත්‍ය නාටක නිර්මාණය කළ බව
★ නව ආකාරයක චිත්තාකර්ෂණීය රංග වස්ත්‍රාභරණ සහ ආභරණ යොදා ගත් බව

නම් කිරීමට ලකුණු 01
කරුණු 5 ක් වත් ලියා ඇත්නම් ලකුණු 05
- ලකුණු 06

**II** දේශීය මුද්‍රානාට්‍ය කෘතිය තොරගෙන එහි රංග වස්ත්‍රාභරණ හා පසුතල නිර්මාණ පිළිබඳ අගයීමක් කරන්න.
★ පටාචාරා
- රංගවස්ත්‍රාභරණ : සිටුතුමා, සිටුදේවිය, තාරා කුමරිය, සොහොයුරිය හා කුමරියගේ කුඩා කළ යෙහෙළියන්ගේ රංග වස්ත්‍රාභරණ ඉන්දියාවෙන් ගෙන්වන ලද රංග වස්ත්‍රාභරණයන් බව
- මෙම ඇඳුම් සඳහා දිලිසෙන පබළු මාල රජ පවුලක භාවිත රංග වස්ත්‍රාවලට ගැලපෙන ලෙස සකස් කර ඇතිබව
★ පසුතල නිර්මාණ
- පසුතල නිර්මාණයේදී වරෙක රජ මාළිගාවක් ලෙස වරෙක ආශ්‍රමයක් ලෙස ද වෙනස් වන පරිදි සකස් කර ඇතිබව

**III** සමාජ විවරණය සඳහා කෝලම් නාටක චරිත ඉවහල් කොට ගෙන ඇති ආකාරය ජස හා මුදලි කෝලම් ඇසුරින් පැහැදිලි කරන්න
★ අව්‍යාජත්වය චරිත තුළ දක්නට ඇතිබව
★ ඇඳුම් පැළඳුම් හා වෙස් මුහුණු වලින් චරිත ස්වභාවය තීව්‍රකර දැක්වෙන බව
★ ජස හා මුදලි චරිත මගින් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් හාස්‍යයට හා උපහාසයට ලක්කර ඇතිබව
★ ජසයාගේ චරිතය තුළින් බීමත්කම. සුරාව, පවුල් සංස්ථාව තුළ ඇති නොසන්සුන්කම්, අඹු සැමි සබඳතා ගැටුම් හා බහු විවාහය
★ මුදලි - කාන්තා ලොල්බව, අල්ලස, රාජකාරිය පැහැර හැරීම මාන්නය පිළිබඳ සමාජ විවරණයක් ඇති බව
★ චරිත ස්වභාවයන් නර්තන ගායන වාදන යන අංගයන්ගෙන් සහ සම්බන්ධයෙන් මනාව නිරූපණය කරමින් ප්‍රේක්ෂකයින්ට වින්දනයක් හා පණිවුඩයක් ලබාදෙන බව

එක් චරිතයකට ලකුණු 4 x 2 = ලකුණු 08

(7) I ★ චිත්‍ර කලාවේ මූලිකාංග වර්ණ, රේඛා, හැඩ, හැඩතල, අවකාශය හා ආකෘතිය බව
★ ආනුෂාංගික අංග වලින් නර්තනය අලංකරණය වන බව
★ ආනුෂාංගික අංග තුළ චිත්‍ර කලාව සුසංයෝග වන බව
★ නර්තන නිර්මාණයේ සාර්ථකත්වයට මූලිකාංග බලපාන බව

ලකුණු 06

II ★ ඇඹීම හා නෙළීම චිත්‍ර කලාවේ ප්‍රධාන මාධ්‍යයක් බව හා එකී අංග බලි ශාන්ති කර්මය තුළ දැකිය හැකි බව
★ බලි ඇඹීම හා ඇඳීම කලාව චිත්‍ර විෂය හා ඍජුව භාවිතා වන බව
★ බලි වර්ණ ගැන්වීම චිත්‍ර විෂය හා සුවිශේෂී බව
★ වර්ණ, රේඛා, හැඩ හා හැඩතල වලින් විද්‍යාමාන වන බව

ලකුණු 06

III ★ නර්තන අංගයක් ඉදිරිපත් කිරීමට වාදනයක් අවශ්‍ය බව
★ සංගීතය යනු වාදනය, ගායනය බව
★ එම නිසා නර්තනයක දී ගායනය සහ වාදනය ප්‍රධානම අංග ලක්ෂණ වන බව
★ සාම්ප්‍රදායික නර්තන තුළ බෙර වාදනය හා ඒ සමග යෙදෙන විවිධ නාද මාලාවන්ට අනුව ගැයෙන ගායනා මගින් නර්තනය පෝෂණය වන බව
★ ගැමි නැටුම්. ගැමි නාටක වල ගායනය හා වාදනය තුළින් එකී නර්තන පෝෂණය වී ඇති බව

ලකුණු 08

(8) I ★ රූපවාහිණී නර්තන වැඩ සටහන් නම් කිරීම
★ නර්තන වැඩසටහන් සඳහා සහභාගී වන පිරිස වැඩි වීම
★ තරඟකාරී බව හේතුවෙන් නව නිර්මාණ බිහිවීම
★ රංග වස්ත්‍රාභරණ නිර්මාණ කරණය වීම
★ නර්තන සඳහා ගායන, වාදන, ඉහළ ප්‍රමිතියකින් යුතුව සකස් වීම
★ නව නිර්මාණ බිහිවීම..........................ආදි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු 06යි

II ★ රූපවාහිණී මාධ්‍යයට උචිත රංග වස්ත්‍රාභරණ භාවිතය පිළිබඳ කරුණු ලියා ඇත්නම්
★ තාක්ෂණයට උචිත රංග වස්ත්‍රාභරණ පිළිබඳව ලියා ඇත්නම්
★ අංග රචනය උචිත ලෙස භාවිතා කර ඇති බව
★ තාක්ෂණය හා අංග රචනය අතර ඖචිත්‍ය භාවය
★ නර්තනයේ සාර්ථකත්වයට රංග වස්ත්‍රාභරණ හා අංග රචනය බලපාන බව ලකුණු - 06

III <u>යහපත් ප්‍රතිඵල</u>
★ සමහර නර්තන අංග දේශීය අනන්‍යතාව සුරකෙන පරිදි නිර්මාණය වීම
★ සිසු ශක්‍යතා, කුසලතා මතු කෙරෙන බව
★ රස වින්දනයට ඉවහල් වන බව
★ විවිධ නිර්මාණ බිහිවන බව
★ දේශිය නර්තන කලාවේ අනන්‍යතාවය ලෝකය පුරාම ව්‍යාප්ත වන බව
★ සියලුම වයස් කාණ්ඩ වලට සහභාගී වියහැකි බව
★ තාක්ෂණය, රංග වස්ත්‍රාභරණ නර්තනයේ පෝෂණයට යොදා ඇති බව

<u>අයහපත් ප්‍රතිඵල</u>
★ දේශීය සාරධර්ම පරිහාණියට පත්වන ආකාරයෙන් සමහර නර්තන අංග නිර්මාණය වීම
★ උචිත නොවන රංග වස්ත්‍රාභරණ භාවිතා කිරීම
★ දේශීය අනන්‍යතාව තුළ නිර්මාණය විය යුතු නර්තන අංග සඳහා විවිධ සම්මිශ්‍රණ යොදා ගැනීම.
★ සාම්ප්‍රදායික හා සාරධර්ම අනන්‍යතාව ගිලිහී යාම
★ තරඟකාරී බව නිසා ආත්මාර්ථකාමිත්වය එකිනෙකා අභිබවා යාම ලකුණ - 08

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....................................

## 52 - නර්තනය (දේශීය)

## ප්‍රායෝගික පරීක්ෂණය

| අංක | පරීක්ෂණ අයිතමය | | ලකුණු |
|---|---|---|---|
| 01 | ගායනය | I කැමති ගායනයක්<br>II උඩැක්කි කවියක්<br>III ග්‍රහ පන්ති කවියක්<br>VI නෙළුම් කවියක් | 5 x 4<br>20 |
| | තාල අවබෝධය | I දොං ජිංත ගත දොංත වට්ටමේ පළමු අඩව්ව තාල තබා කීම.<br>II කුදංත ගත දොං වට්ටමේ දෙවන පදය , කස්තිරම, අඩව්ව නර්තනය. | 10 |
| 03 | කැමති නර්තනය | ඔබ ඉගෙනගන්නා නර්තන සම්ප්‍රදායේ විෂය නිර්දේශයට අයත් ශිල්පීය ප්‍රාගුණ්‍ය දැක්විය හැකි ශාස්ත්‍රීය නර්තනයක් (ප්‍රශ්ණ පත්‍රයේ ඇතුලත් නොවන) | 10 |
| 04 | වෙනත් සම්ප්‍රදායකට අයත් නර්තනයක් | ශුද්ධ මාත්‍රය - '' දෙගත් ගතකුදොම්'' පදයට අදාල කවිය ඉරට්ටිය හෝ<br>මුල් මාත්‍රය - සසිරි සිරිලක ... කවිය,කලාසම, අඩව්ව | 10 |
| 05 | වන්නම් | මයුරා වන්නම ( කස්තිරම, සීරුමාරුව, අඩව්ව සමග) | 10 |
| 06 | පූජා භාණ්ඩ භාවිත නර්තන අංගයක් | කොතල පදය (මධ්‍ය ලය) | 10 |
| 07 | ගායන සහිත නර්තන අංගයක් | අස්නෙ (දොංත තදොං පදය සිට) ඉදිරියට | 10 |
| 08 | වාදනය | 01 හෝ 02 බෙර සරඹය ලයතුනට වාදනය<br>කැමති වන්නමක කවියක් ගයමින් වාදනය සහ කස්තිරම | 10 |
| 09 | සිද්ධියක් ඇසුරෙන් චරිත නිරූපනය | නිවැරදිව සිල් රැකීමට අපොහොසත් වූ උපාසිකාවක් විවිධාකාරයෙන් හැසිරෙයි. ( මෙම සිද්ධිය තවදුරටත් ගොඩ නගාගෙන ඉදිරිපත් කල යුතුය<br>චරිතය - උපාසිකාව | 10 |

(මුළු ලකුණු 100)